# පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
## POVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE

372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ<br>பணிப்பாளர்<br>Director | 025 - 2234673 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 025 - 2224173 | ෆැක්ස්<br>பெக்ஸ<br>Fax | 025 - 2224173 |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | NCP/SS/E1/20 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015/10/02 |


පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 04/2015

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සංවර්ධන සහකාර නිලධාරීන්/ සංවර්ධන නිලධාරී වෙත,

**නිවාස ආධාර මුදල් ගෙවීම**

තමන් හෝ තම පවුල සඳහා නිවහනක් ඉදි කිරීම ආරම්භ කර මේ වන විට එය අවසන් කර ගත නොහැකිව සිටින වයෝවෘද්ධ, ආබාධිත සාමාජිකයෙකු පවුලේ සිටින, ගෘහ මූලිකයා ආබාධිත හෝ රෝගාබාධයන්ට ලක්වූ, වැන්දඹු හෝ අන්ත දිළිදු පවුල් සඳහා නිවසේ ඉතිරි කටයුතු සම්පූර්ණ කර ගැනීම පිණිස සෙවිළි ආධාර හෝ වෙනත් කොටසක් සම්පූර්ණ කිරීම සඳහා දෙනු ලබන ආධාර මුදලක් වශයෙන් මෙම දෙපාර්තමේන්තු නිවාස ආධාර වැඩසටහන යටතේ ගෙවනු ලබන රු. 12,000.00 ක නිවාස ආධාර මුදල රු. 25,000.00ක් දක්වා වැඩි කිරීමට තීරණය කර ඇත.

02. පළමු වාරිකය රු. 15,000.00ක් ලෙස හා එම මුදල් වැය කළ ආකාරයේ ප්‍රගතිය මත දෙවන වාරිකය රු. 10,000.00ක් ලෙස මෙම ආධාර මුදල වාරික දෙකකින් ගෙවනු ලැබේ.

03. මෙම නිවාස ආධාර මුදල් ගෙවීම සම්බන්ධයෙන් වන විධිවිධාන හා මග පෙන්වීම් පහත පරිද්දෙනි.

1. නිවාස ආධාර ලැබීමට සුදුස්සන්
   - නිවස අර්ධ වශයෙන් ඉදිකර තිබෙන අයෙකු වීම
   - ඉඩමේ අයිතිය තමන් සතු වීම
   - මාසික ආදායම රු. 30000ට වඩා අඩු අයකු වීම
   - නිවස තනා ගැනීමට ආධාර නොලද හොත් අනාථ භාවයට පත්විය හැකි තත්වයක පසුවන්නකු වීම

2. නිවාස ආධාර ලබා දීම ප්‍රතික්ෂේප කෙරෙන අවස්ථා
   - ඉල්ලුම්කරුට ඉඩමේ අයිතිය නොතිබීම
   - ඉල්ලුම්කරුට පදිංචියට සුදුසු තවත් නිවසක් තිබීම
   - ආදායම් සීමාව ඉක්මවීම
   - මෙම මුදල් යොදවා නිවසේ කටයුතු නිම කර ගන්නා ආකාරය තහවුරු කිරීමට නොහැකි වීම

3. නිවාස ආධාර ගෙවීමේ ක්‍රියා පටිපාටිය
   - අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද නිවාස ආධාර අයදුම්පත ග්‍රාම නිලධාරි, සංවර්ධන සහකාර (සමාජ සේවා)/ සංවර්ධන නිලධාරී (සමාජ සේවා) නිර්දේශය, ප්‍රාදේශීය ලේකම් නිර්දේශය සමගින් ඉඩමේ අයිතිය සනාථ කෙරෙන ලියවිලි පිටපත් සමගින් පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම

- සමාජ සේවා පලාත් අධ්‍යක්ෂ එම ඉල්ලීම් පරික්ෂා කර බලා ඉල්ලීම අනුමත කර ඒ අනුව අනුමත කළ මුදල සඳහා වන මුදල් ප්‍රතිපාදන වශයෙන් හෝ චෙක්පත් ලෙස අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පලාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් යොමු කරනු ලැබේ.
- අදාළ මුදල් යොදවා අදාළ නිවාසය පිළිසකර කරන්නේදැයි සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරී/ සංවර්ධන නිලධාරී විසින් අධීක්ෂණය කළ යුතුය. එසේ නොකරන්නේ නම් ගෙවූ මුදල් වහාම ආපසු ගෙවන ලෙස අදාල අයට දැන්විය යුතු අතර වෙනත් ආධාර සඳහා ඔවුන් නොසලකා හැරිය යුතුය.
- වාරික වශයෙන් ගෙවනු ලබන අවස්ථාවන් හි දී ලබා දුන් වාරිකයෙන් නිම කළ වැඩ ගැන සෑහිමකට පත් වන්නේ නම් පමණක් දෙවැනි වාරිකය සඳහා සමාජ සේවා නිලධාරී/ සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරී තම නිර්දේශ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.
- ඒ අනුව දෙවන වාරිකය ගෙවීම ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කිරීම හෝ නොකිරීම තීරණය කෙරෙනු ඇත.
- ලබා දුන් වාරිකයෙන් සෑහිමකට පත්විය හැකි පරිදි වැඩ නිම කර හෝ අවම වශයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය වත් සපයා ගෙන නොමැති නම් ඉතිරි වාරික ගෙවීම් සඳහා නිර්දේශ ඉදිරිපත් නොකළ යුතුය.

04. උතුරු මැද පළාත් සභාවේ 2015/08 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 2015/36 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අජන්ත ගුණවර්ධන,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.